# 2. මහ බැංකුවේ කටයුතු සහ ගිණුම්

1977 වර්ෂය සඳහා මහ බැංකුවේ මුදල් ගිණුම් තුන්වන පරිශිෂ්ටයෙහි හත්වැනි සංඛ්‍යා සටහනින් ඉදිරිපත් කෙරේ. 1976 වසර හා සසඳන කල්හි 1977 දෙසැම්බර් අග වන විට දක්නට ලැබුන ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| | | වෙනස (රුපියල් දශලක්ෂ) |
|---|---|---|
| මුළු ඉල්ලුම් වගකීම් | .. | + 1878.8 |
| ව්‍යවහාර මුදල් සංසරණය | .. | + 812.0 |
| ඉල්ලුම් තැන්පතු | .. | + 823.4 |
| විදේශීය ණය ගැනීම් | .. | + 243.4 |
| ජාත්‍යන්තර සංචිතය | .. | + 3503 6 |
| දේශීය වත්කම් | .. | + 309.4 |

\+ වැඩිවීම

1977 නොවැම්බර් 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, ශ්‍රී ලංකා රුපියල පාවීමට ඉඩ හැරීමත් සමගම, එක් එක් වැඩ කරන දිනයක ප. ව. 2.00 ට එ. ජ. ඩොලරයේ, රන්පවුමේ, බටහිර ජර්මන් ඩොයිෂ් මාර්කයේ, ප්‍රංශ ප්‍රැන්කුවේ, ජපාන යෙන්හී සහ ඉන්දියානු රුපියලේ මධ්‍ය අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලදී. වර්ෂය අගදී මෙම මුදල් සඳහා වූ මහ බැංකු අනුපාතිකයන් පහත සඳහන් පරිදි විය.

| මුදල් වර්ගය ඒකක 100ක් | මධ්‍ය අනුපාතිකය | විදුලිය පැවරුම් සඳහා සිය ගනුදෙනු කරුවනට වෙළෙඳ බැංකු මගින් දෙන ලද නිල විනිමය අනුපාතිකයන් | |
|---|---|---|---|
| | | මිලයට ගැනීම | විකිණීම |
| එ. ජ. ඩොලර් | රු. 1556·00 | රු. 1553·00 | රු. 1559·00 |
| රන් පවුම් | රු. 2985·25 | රු. 2979·75 | රු. 2990·75 |
| ඩොයිෂ් මාර්ක් | රු. 742·50 | රු. 741·00 | රු. 744·00 |
| ප්‍රංශ ප්‍රැන්ක් | රු 332·20 | රු. 331·45 | රු. 332·95 |
| ජපාන යෙන් | රු. 6·4880 | රු. 6·4730 | රු. 6·5030 |
| ඉන්දියානු රුපියල් | රු. 185·00 | රු. 184·60 | රු 185·40 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු තුන්වන පරිශිෂ්ටයේ අටවන සංඛ්‍යා සටහනෙන් දැක්වේ.

රජයේ සුරැකුම්පත් හා වාණිජ හා නිෂ්පාදන ණය වලට අදාළ භාවිතීය පොරොන්දු නෝට්ටු මත දෙන ලද අත්තිකාරම් සඳහා 1976 දී වූ සියයට 6½ වාර්ෂික මහ බැංකු පොළිය, 1977 ජනවාරි 26 වැනි දින සිට වර්ෂයකට සියයට 8½ දක්වාත්, අනතුරුව 1977 අගෝස්තු 31 වැනි දින සිට වර්ෂයකට සියයට 10 දක්වාත් වැඩි කරන ලදී. සහතික මිල ක්‍රමය යටතේ වී මිලයට ගැනීම සහ මෙරට වගා කරන ලද කෘෂිකාර්මික ද්‍රව්‍ය මිලදී ගැනීම, විකිණීම හා ගබඩා කිරීම සඳහා මුදල් සැපයීම් වස් සමූපකාර සමිතිවලට හා කෘෂිකාර්මික පළදාවර්ධන කමිටු වලට දෙන ලද අත්තිකාරම් සඳහා වන පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන මහ බැංකුව විසින් වෙළෙඳ බැංකු වලට දෙනු ලැබූ අත්තිකාරම් සඳහා පොළිය වර්ෂයකට සියයට 3 මට්ටමෙහිම නොවෙනස්ව පැවතුනි. වී, එළවලු හා අනෙකුත් නම් කරන ලද භෝග වර්ග නිෂ්පාදනය හා සම්බන්ධව සමූපකාර සමිති වල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා ගෙන මහ බැංකුව විසින් වෙළඳ බැංකු වලට දෙනු ලබන අත්තිකාරම් සඳහා වන පොළිය වර්ෂයකට සියයට 1½ මට්ටමෙහිම නොවෙනස්ව පැවතිනි. එසේ වුවද, මෙම පහසුකම ලබන වෙළඳ බැංකු එකී පොරොන්දු නෝට්ටු නිකුත් කළ අයගෙන් වර්ෂයකට සියයට 8 කට (නියමිත දිනට බේරුම්

කළහොත් සියයට 8 ක ප්‍රතිදානයකට යටත්ව) වඩා වැඩි පොළියක් අය නො කළ යුතුය. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකු වට්ටම් අනුපාතිකය අන්තිමට පිළිගත් සාමාන්‍ය ටෙන්ඩර් අනුපාතිකයට වඩා වර්ෂයකට සියයට 1/8 කින් වැඩිව 1977 ඔක්තෝබර් 17 වැනි දින තෙක් පැවතුන අතර, මෙය ටෙන්ඩර් මගින් හෝ මහ බැංකුවෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගත් ප්‍රමාණයට වඩා සියයට 1/8 කින් වැඩි වනසේ 1977 ඔක්තෝබර් 18 වැනි දින සිට සංශෝධනය කරන ලදී.

### විදේශීය මුදල් නෝට්ටු

නියමිත විනිමය අනුපාතිකයනට අනුව ශ්‍රී ලංකාවේ කටයුතු කරන බැංකු වලින් නම් කරන ලද විදේශීය නෝට්ටු වර්ග මිලදී ගැනීම සහ එකී බැංකු වලට එම නෝට්ටු විකිණීම මහබැංකුව විසින් තවදුරටත් කර ගෙන යන ලදී.

### ණය සඳහා ඇපවීමේ වැඩ පිළිවෙල

1977 දී, එළවලූ සහ අනෙකුත් නම් කරන ලද භෝග වර්ග වගා කිරීම, තේ නැවත වගා කිරීම සහ තේ කම්හල් සංවර්ධනය සඳහා වෙළඳ බැංකු විසින් දෙන ලද රුපියල් 46,32,71,752.34 සඳහා මහ බැංකුව ඇප විය.

### මැදි හා දිගු කාලීන ණය

මැදි හා දිගු කාලීන ණය වැඩ පිළිවෙල යටතේ ණය දෙන ආයතනයන්ට මහ බැංකුව විසින් දෙන ලද ප්‍රතිමූල්‍ය ණය සඳහා පොළී අනුපාතික පහත දැක්වෙන පරිදි පැවතුනි'

(අ) කෘෂිකර්මය හෝ කර්මාන්ත නගා සිටුවීම හෝ සංවර්ධනය සඳහා වර්ෂයකට සියයට 6½ ක්.

(ආ) තේ කම්හල් නවීකරණය හා නව කම්හල් ඉදි කිරීම සඳහා (තේ පාලක විසින් එවැනි ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළියෙන් කොටසක් ගෙවන අවස්ථාවන්හිදී).

(i) දේශීය වියදම් සඳහා සියයට 6 ක්.

(ii) විදේශීය විනිමය වියදම් සඳහා සියයට 8 ක්.

(ඇ) කෘෂිකාර්මික නොවන කටයුතු සඳහා වර්ෂයකට සියයට 7½, රුපියල් 1,03,11,000 ක ප්‍රතිමූල්‍ය ණය වසර තුළදී ණය දෙන ආයතනයන්ට ප්‍රදානය කරනු ලැබීය.

### ව්‍යවහාර මුදල් නිකුතුව

1977 අගදී මුළු ව්‍යවහාර මුදල් සංසරණය රුපියල් 32,191 ලක්‍ෂයක් විය. මෙය, 1976 අග තත්වය හා සසඳන විට රුපියල් 8,120 ලක්‍ෂයක වැඩිවීමක් පෙන්වයි. ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙහි රුපියල් 7,976 ලක්‍ෂයක වැඩිවීමක් හා කාසි සංසරණයෙහි රුපියල් 144 ලක්‍ෂයක වැඩිවීමක් දක්නට ලැබුණි. ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයෙහි ප්‍රධාන වැඩිවීම සිදුවූයේ රුපියල් 100 සහ රුපියල් 50 වටිනාකම් වලින් යුත් නෝට්ටු වලය. අනෙකුත් වටිනාකම් වලින් යුත් නෝට්ටු නොවෙනස්වම වාගේ පැවතිනි. විමර්ශනයට භාජනය වන වර්ෂය තුල නෝට්ටු හා කාසි වල අළුත් නිකුතුන් කිසිවක් සිදු නොවීය.

### බැංකු හර බද්ද

බැංකු හර බද්ද එකතු කිරීම තවදුරටත් මහ බැංකුව වෙත පැවරුනි.

**අනිවාර්ය ඉතිරිකිරීම**

1971 අංක 6 දරන අනිවාර්ය ඉතිරි කිරීම් පනත සහ 1972 අංක. 15 දරන ආදයම් උපරිම හා අනිවාර්ය ඉතිරිකිරීම් නීතිය යටතේ එකතු කරන ලද මුදල් වල භාරකරු වශයෙන් තවදුරටත් ක්‍රියා කළ මහබැංකුව රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල පරිපාලනය කෙළේය. වර්ෂය තුළදී දයකයන් වෙතින් ලැබුනු 3305 ක් පමණ වන අයදුම්පත් වෙනුවෙන් බැංකුව රුපියල් 64,05,435.57 (පොළියද ඇතුළත්ව) ක් ගෙවන ලදී.

**ආසියානු නිෂ්කාශන සංගමය**

මහ බැංකුව ආසියානු නිෂ්කාශන සංගමයට සහභාගි වන බැංකුවකි. නිෂ්කාශන සංගමය මගින් ගනුදෙනු බේරුම් කිරීම් වශයෙන්, ශ්‍රී ලංකාව සංගමයට සහභාගි වන බැංකු වලට 1977 සඳහා ගෙවන ලද (ශුද්ධ) මුදල රුපියල් 2980,77,871.43 ක් විය.

**විදේශ විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය**

1968 අංක 28 දරන විදේශීය විනිමය හිමිකම් සහතික පත් පනත යටතේ ක්‍රියාත්මක කරන ලද විදේශීය විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය 1977 නොවැම්බර් 15 වැනි දින සිට ක්‍රියාත්මක වූ 1977 අංක. 17 දරන විදේශීය විනිමය හිමිකම් සහතික (සංශෝධන) පනතින් ප්‍රතිශෝධනය විය.

**ආදයම හා වියදම**

1977 වර්ෂය සඳහා මහ බැංකුවේ ආදයම රුපියල් 28,09,27,189 ක් වූ අතර සංචිත වෙත් කිරීම් සහ ඉඩම් සහ ගොඩනැගිලි හා ලී බඩු උපකරණ ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදනය ඇතුළු මුළු වියදම රුපියල් 27,99,27,189 ක් විය. රුපියල් 10,00,000 ක ශුද්ධ ලාභය මුදල් නීති පනතේ 39 (ආ) වගන්තිය ප්‍රකාර අතිරික්තයට නො යන ලදී.

## බැංකු පරිපාලනය

මුදල් නීති පනතේ 29 (i) වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්තමේන්තුව විසින් 1977 වර්ෂයේදී වෙළඳ බැංකු 6 ක් පරීක්ෂා කරන ලදී. ඒ අනුව, 1976/77 පරීක්ෂණ කාල සීමාව තුළදී ශ්‍රී ලංකාවේ සෑම වෙළඳ බැංකුවකම පරීක්ෂණ කටයුතු සම්පූර්ණ කරන ලදී.

1975 අංක 32 දරන පනතින් සංශෝධනය කරන ලද 1970 අංක 27 දරන බැංකු භර බදු ආඥා පනත යටතේ පරිපාලනය හා සම්බන්ධ කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් දිගටම කර ගෙන යන ලද අතර, පනතේ 15 වැනි වගන්තිය යටතේ, බලයලත් නිලධාරියාගේ සහතික සැපයිය යුතු තොරතුරු වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමේ අරමුණ ඇතිව, වෙළඳ බැංකු පරීක්ෂා කිරීම කරගෙන යන ලදී.

## සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය හා දිගු කාලීන ණය අරමුදලෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා අනුමත ණය දෙන ආයතන මගින් ඉදිරිපත් කරනු ලැබූ සංවර්ධන ව්‍යාපෘති විශ්ලේෂණය කිරීම සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් තව දුරටත් කරගෙන යනු ලැබීය. පහත සඳහන් අරමුණු සඳහා 1977 වර්ෂය තුළදී ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරන ලදී.

| | | |
|---|---|---|
| හෝටල් ව්‍යාපාරය | රුපියල් දශලක්ෂ | 9·0 |
| කාර්මික ව්‍යාපෘති | රුපියල් දශලක්ෂ | 7·2 |
| ධීවර ව්‍යාපෘති | රුපියල් දශලක්ෂ | 1·8 |
| | | 18·0 |

රුපියල් දශලක්ෂ 2 කින් පමණ යුක්ත වූ තේ කර්මාන්ත ශාලා නවීකරණ ව්‍යාපෘතීන් මෙම දෙපාර්තමේන්තුව වෙත තේ කොමසාරිස් විසින් අගැයීම පිණිස යොමු කරන ලදී. තේ කර්මාන්ත ශාලා නවීකරණය සම්බන්ධ අයැදුම් සලකා බැලීම පිළිබඳව විකල්ප ක්‍රියා මාර්ගයක් පිළියෙල කරන ලද බව තේ කොමසාරිස් තැන විසින් මෙම දෙපාර්තමේන්තුවට පසුව දන්වා එවනු ලැබීය.

මෙම දෙපාර්තමේන්තුව විසින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුව තේ කර්මාන්තයේ මුදල් ආයෝජනය කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් හඳුනා ගැනීමේ අධ්‍යයනයක් කිරීමට භාර ගන්නා ලදී.

තවද මෙම දෙපාර්තමේන්තුව ධීවර සංවර්ධන ව්‍යාපෘති පාලනය කරනු ලබන ණය කොමිටියේ සේවය කිරීමද කරගෙන යනු ලැබීය. මෙම ව්‍යාපෘතියට අවශ්‍ය විදේශ විනිමය පියවා ගනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණය ආධාරයක් මගිනි. 1976 අගෝස්තු මාසයේදී අරඹන ලද මෙම ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද නොයෙකුත් වර්ගයේ ධීවර යාත්‍රා පහත දක්වා ඇත.

| යාත්‍රා වර්ගය | ව්‍යාපෘතිය යටතේ නිකුත් කිරීමට අපේක්ෂිත යාත්‍රා ගණන | 1977 වර්ෂය තුළදී නිකුත් කරන ලද යාත්‍රා ගණන | 1976 පටන් නිකුත් කරන ලද මුළු යාත්‍රා ගණන |
|---|---|---|---|
| අඩි 28 | 200 | 59 | 96 |
| අඩි 38 | 30 | 3 | 6 |

ධීවර යාත්‍රා මිළදී ගැනීමට බලාපොරොත්තු වන්නන්ගේ ප්‍රයෝජනය සඳහා අඩි 38 ධීවර යාත්‍රා වල මූල්‍යමය ප්‍රරෝහන ශක්තිය පිළිබඳ අගැයීමක් ද දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. මීට අමතරව මෙම ව්‍යාපෘතිය යටතේ නිකුත් කරනු ලබන ධීවර යාත්‍රා සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ සහ ව්‍යාපෘතියට අයත් ධීවර යාත්‍රා මගින් අල්ලනු ලබන මසුන් අලෙවි කිරීම සඳහා ප්‍රාදේශීය ධීවර අලෙවි සමූපකාර සංගම් දෙකක් ඇති කිරීමේ ක්‍රියා පිළිවෙල සැලසුම් කිරීමේ කාර්යයන්ට ධීවර අමාත්‍යාංශය සහ ණය සපයන බැංකු සමග මෙම දෙපාර්තමේන්තුවද සහභාගි විය.

අඩි 38 ධීවර යාත්‍රා අලෙවිය නැංවීමේ පියවරක් වශයෙන් ධීවර අමාත්‍යාංශය මගින් පවත්වන ලද ගැඹුරු මුහුදේ සහ අක් වෙරළේ මසුන් ඇල්ලීම පිළිබඳව කරන ලද සම්මන්ත්‍රණයකටද දෙපාර්තමේන්තුව සහභාගි විය.

1977 ජනවාරි මස 03 වැනි දින සිට අපනයන ණය සහතික කිරීමේ ක්‍රමයක් ක්‍රියාවට නංවනු ලැබීය. රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙය ක්‍රියාත්මක කර ගෙන යයි. මෙම ක්‍රමය සැලසුම් කර ඇත්තේ පාරම්පරික නොවන භාණ්ඩ අපනයන කරුවන් සඳහා එම අපනයනයන් මිළදී ගැනීම, නිෂ්පාදනය කිරීම, සැකසීම හෝ ඇහිරීම සඳහා වාණිජ බැංකු මගින් ණය දීම වඩාත් පහසු කරලීම සඳහාය. වාණිජ බැංකුවක් විසින් සහතික කරන ලද අත්තිකාරමක් වෙනුවෙන් එම බැංකුව විසින් දැරීමට සිදු විය හැකි අලාභයෙන් තුනෙන් දෙකක් මෙම ක්‍රමය මගින් ආවරණය කරනු ලබයි. මේ යටතේ ණය ගැතියන් විසින් එක් එක් මාසයේ ගෙවීමට ඇති උපරිම හිඟ මුදල වෙනුවෙන් මසකට රු. 100/- කට ශත 10 ක් වශයෙන් ගණනය කරන ලද වාරිකයන් වාණිජ බැංකු විසින් මහ බැංකුවට ගෙවිය යුතුය.

1977 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 22.8 ක සීමාවකට යටත් වූ ණය සඳහා ඇප සහතික 41 ක් නිකුත් කර ඇත. අනුමත කරන ලද ණය සීමාවන් පිළිබඳ භාණ්ඩ අනුව වූ වර්ගීකරණයක් පහත දක්වා ඇත.

| | භාණ්ඩ වර්ගය | නිකුත් කරන ලද ඇප සහතික ගණන | අනුමත කරන ලද මුළු ණය සීමාව (රු.) |
|---|---|---|---|
| 1. | ටින් කරන ලද පළතුරු සහ පළතුරු යුෂ | 1 | 650,000 |
| 2. | කෙඳි වර්ග හා අනෙකුත් කෙඳි නිෂ්පාදන | 5 | 845,000 |
| 3. | නිම කළ ඇඳුම් | 7 | 8,300,000 |
| 4. | කුළුබඩු | 8 | 4,825,000 |
| 5. | මැණික්, ස්වර්ණාභරණ, ඔපකළ දියමන්ති යනාදිය | 2 | 2,250,000 |
| 6. | සම්භාණ්ඩ නිෂ්පාදන | 2 | 650,000 |
| 7. | වෘතාන්ත චිත්‍රපටි | 1 | 600,000 |
| 8. | නිවර්තන කලාපීය සජීවී මසුන් සහ ජලජ පැලෑටි | 2 | 35,000 |
| 9. | අත්කම් භාණ්ඩ සහ විසිතුරු භාණ්ඩ | 3 | 240,000 |
| 10. | රබර් මූලික භාණ්ඩ | 1 | 650,000 |
| 11. | මුහුදෙන් ලබා ගන්නා නිෂ්පාදන | 4 | 1,775,000 |
| 12. | ගෘහභාණ්ඩ සහ අනිකුත් ලී බඩු නිෂ්පාදන | 2 | 360,000 |
| 13. | සුඛෝපභෝගී මුහුදු යාත්‍රා | 1 | 1,500,000 |
| 14. | කොටට පුළුන් | 2 | 90,000 |
| | | 41 | 22,770,000 |

## සේවක අර්ථසාධක අරමුදල - 1977

සේවක අර්ථ සාධක අරමුදලේ මුදල් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගින් මුදල් මණ්ඩලය භාරයේ දිගටම පැවති අතර, සංශෝධිත 1958 අංක. 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5 වන වගන්තිය ප්‍රකාර මෙම මුදල් පිළිබඳ අනෙකුත් කටයුතු දිගටම කරගෙන යන ලදී. මෙහෙයවුම් කටයුතු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහතින් දක්වා ඇත.

### සාමාජිකත්වය සහ ලියාපදිංචි සේවායතන

කම්කරු දෙපාර්තමේන්තුව සතුව ඇති දත්තයන් අනුව ලියාපදිංචි සේවායතන සංඛ්‍යාව 1976 දී 78,776 සිට 1977 දී 81,959 දක්වා වැඩිවිය මෙය සියයට 4 ක වැඩිවීමකි. මෙම සේවායතන යටතේ ලියාපදිංචි සේවක සංඛ්‍යාව 1976 දී 1,317,841 ක් වූ අතර 1977 අවසානයේ දී සාමාජිකත්වය 1,344,528 ක් විය. මෙය සියයට 2 ක වැඩි වීමකි.

### දායක දීමනා

1977 වර්ෂයේ දී අරමුදල වෙත ලැබුණු දායක දීමනා රුපියල් දශ ලක්ෂ 304.8 ක් විය. මෙය කලින් වර්ෂයේ ලැබූ දායක දීමනා මට්ටමට වඩා සියයට 28.4 ක වැඩිවීමක් හෝ රුපියල් දශලක්ෂ 67.5 ක වැඩිවීමකි. 1977 දී දායක දීමනා වැඩිවීම කෙරෙහි අරමුදලේ සාමාජිකත්වය වැඩිවීම මූලික වශයෙන් බලපාන ලදී.

සාමාජික ශේෂයන් වශයෙන් 1977 අවසානයේ රුපියල් දශලක්ෂ 2,396.2 ක් ව පැවැති අතර, මෙය 1976 එකතුවට වඩා රුපියල් දශලක්ෂ 381.2 ක හෝ සියයට 14 ක වැඩිවීමකි

**ආයෝජන**

1977 වර්ෂය තුළදී අරමුදල විසින් දළ වශයෙන් රුපියල් දශලක්ෂ 398.0 ක මුදලක් රජයේ සුරකුම් පත් වල ආයෝජන කරනු ලැබීය. මෙය 1976 ට වඩා රුපියල් දශලක්ෂ 106.2 ක හෝ සියයට 36.4 ක වැඩිවීමකි. අරමුදලේ මුළු ආයෝජන ප්‍රමාණය 1977 අවසානයේ රුපියල් දශලක්ෂ 2,491.4 ක් වූ අතර 1976 දී රුපියල් දශලක්ෂ 2,093.4 ක් විය.

අරමුදලෙහි මුදල් ආයෝජනයන් හා අවශ්‍ය අවස්ථාවන්හි දී මණ්ඩලයට උපදෙස් දීම සඳහා නියෝජ්‍ය අධිපති, ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරි සහ ලේකම් වශයෙන් සේවක අර්ථසාධක අරමුදල් අධිකාරිගෙන් සමන්විත ආයෝජන කොමිටියක් මුදල් මණ්ඩලය විසින් අවුරුද්දේ අවසාන කාලච්ඡේදයේදී පිහිටුවන ලදී.

**ආයෝජන වලින් ආදායම**

1977 දී අරමුදලේ ආයෝජන වලින් ලද ආදායම කලින් වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 27.6 ක් හෝ සියයට 20.8 ක වැඩිවීමක් වූ අතර, කලින් වර්ෂයේ වැඩිවීම රුපියල් දශලක්ෂ 15.6 ක් හෝ සියයට 13.3 ක්.විය. 1977 දී ආදායම රු. 160,222,583 ක් වූ අතර 1976 දී ආදායම රු. 132,603,366 ක් විය.

**ආපසු ගෙවීම්**

ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් 1977 දී ගෙවන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 89.4 ක් විය. මෙය 1976 වර්ෂය හා සසඳන විට රුපියල් දශලක්ෂ 15.0 ක අඩුවීමකි.

**සාමාජික ශේෂයන් මත පොළී**

අරමුදලේ මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමින් සාමාජිකයින් ගේ ශේෂ වෙනුවෙන් පොළිය ගෙවීමට සේවක අර්ථසාධක අරමුදලට නියමව ඇත. 1976 දී සියයට 6 ක් වූ පොළී අනුපාතිකය 1977 දී සියයට 7.5 දක්වා වැඩි කරන ලදී. සාමාජික ශේෂයන් මත ගෙවිය යුතු පොළිය, 1977 අවසානයේ දී රුපියල් දශලක්ෂ 179.7 ක් වූ අතර, 1976 දී රුපියල් දශලක්ෂ 120.9 ක් විය. මෙය 1976 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 58.8 ක් හෝ සියයට 48.6 ක වැඩි වීමකි.

දැනට ඇති දත්තයන් මත සකසන ලද, අරමුදලේ මෙහෙයුම් කටයුතු පිළිබඳ සංසන්දනාත්මක සටහනක් උපලේඛනයේ දක්වා ඇත.

**සේ. අ. අ. සංඛ්‍යා ලේඛන 1976/1977**

| | 1976 | 1977 |
|---|---|---|
| 1. ආවරණය වූ සේවායතන සංඛ්‍යාව | 78,776 * | 81,959 * |
| 2. ලියාපදිංචි වූ සාමාජික සංඛ්‍යාව | 1,317,841 * | 1,344,528 * |
| 3. ලැබුණු දයක දීමනා (රුපි.) ** | 237,306,270 | 304,838,236 |
| 4. ආයෝජන (රුපි.) | 291,762,200 | 397,981,740 |
| 5. ආයෝජන වලින් ආදයම (රුපි.) | 132,603,366 | 160,222,583 |
| 6. ආපසු ගෙවීම් (රුපි.) | 104,395,006 | 89,357,790 |
| 7. ආපසු ගෙවීම් සංඛ්‍යාව | 58,993 | 41,157 |
| 8. පොලී අනුපාතිකය (%) | 6·0 | 7·5 |
| 9. සාමාජික ශේෂ මත පොලී (රුපි ) | 120,906,675 | 179,717,325 |

* මූලය:- කම්කරු දෙපාර්තමේන්තුව

** පැවරුම් සඳහා අවිනිශ්චිත ගිණුමට බැර කරන ලද දයක මුදල් හැර.